**විදේශයකදී සිදුවන දරු උපතක් තානාපති කාර්යාලයෙහි ලියපදිංචි කරවා ගැනීම සඳහා උපදෙස්**

01. **ඉංග්‍රීසි කැපිටල් අකුරින් නිවැරදිව සම්පූර්ණ කරන ලද පුරවැසි 01** අයදුම් පත්‍රය සහ එය සමග ඇති අයදුම්කරු (මව/පියා), දරුවා උපදින විට වෙනත් රටක පුරවැසි බව ලබා නොමැති බවට කරනු ලබන ප්‍රකාශය. (අයදුම්පත www.srilankaembassy.fr වෙබ් අඩවියෙන් ලබාගත හැක)

02. පිටපත් තුනකින් යුත් දරුවාගේ උපත පිලිබඳ දෙමව්පියන් විසින් කරනු ලබන ප්‍රකාශය. **(ඉංග්‍රීසි කැපිටල් අකුරින් නිවැරදිව සම්පූර්ණ කරන්න)**

(සැ.යු. දරුවා ඉපදී තුන්මසක් ඇතුළත නම් 16 වන වගන්තියද, තුන්මසකට වඩා වැඩි නම් 24 වන වගන්තියද භාවිතා කරන්න.අයදුම්පත www.srilankaembassy.fr වෙබ් අඩවියෙන් ලබාගත හැක)

03. ප්‍රංශ රජය මගින් නිකුත් කරනු ලබන උප්පැන්න සහතිකයේ මුල් පිටපත සහ ඡායා පිටපත්. (වසරක් තුල කරනු ලබන උපත් ලියපදිංචි කිරීමක් නම් ඡායා පිටපත් දෙකක්ද වසරට වැඩිනම් ඡායා පිටපත් තුනක්ද ඉදිරිපත් කරන්න.)

04. ප්‍රංශ රජය මගින් නිකුත් කරනු ලබන උප්පැන්න සහතිකයේ නිවැරදි ඉංග්‍රීසි පරිවර්තනය සහ ඡායා පිටපත්. (වසරක් තුල කරනු ලබන උපත් ලියපදිංචි කිරීමක් නම් ඡායා පිටපත් දෙකක්ද වසරට වැඩිනම් ඡායා පිටපත් තුනක්ද ඉදිරිපත් කරන්න.)

05.දෙමව්පියන්ගේ උප්පැන්න සහතිකවල මුල් පිටපත් (පරිවර්තන භාරගනු නොලැබේ.) සහ ඡායා පිටපත්. (වසරක් තුල කරනු ලබන උපත් ලියපදිංචි කිරීමක් නම් ඡායා පිටපත් දෙකක්ද වසරට වැඩිනම් ඡායා පිටපත් තුනක්ද ඉදිරිපත් කරන්න.)

06/01. දෙමව්පියන් ලංකාවේදී විවාහ වී නම්, විවාහ සහතිකයේ මුල් පිටපත (පරිවර්තන භාරගනු නොලැබේ.) සහ ඡායා පිටපත් .(වසරක් තුල කරනු ලබන උපත් ලියපදිංචි කිරීමක් නම් ඡායා පිටපත් දෙකක්ද වසරට වැඩිනම් ඡායා පිටපත් තුනක්ද ඉදිරිපත් කරන්න.)

06/02 දෙමව්පියන් විදේශයකදී විවාහ වී නම්, විවාහ සහතිකයේ මුල් පිටපත සමග එහි ඉංග්‍රීසි පරිවර්තනය සහ ඡායා පිටපත්. **මුල් පිටපත අදාල රටේ තානාපති කාර්යාලයෙන් සහතික කරවාගෙන තිබිය යුතුය.** (වසරක් තුල කරනු ලබන උපත් ලියපදිංචි කිරීමක් නම් ඡායා පිටපත් දෙකක්ද වසරට වැඩිනම් ඡායා පිටපත් තුනක්ද ඉදිරිපත් කරන්න.)

06/03 දෙමව්පියන් අවිවාහක නම් පියා විසින් දරුවාගේ පිතෘත්වය භාරගන්නා බවට කරනු ලබන ප්‍රකාශය. **මේ සඳහා දෙමව්පියන් තානාපති කාර්යාලයට පැමිණිය යුතුවේ.** (අයදුම්පත www.srilankaembassy.fr වෙබ් අඩවියෙන් ලබාගත හැක)

07. දරුවා උපදින විට වලංගු, දෙමව්පියන්ගේ ගමන් බලපත් සහ ප්‍රංශයේ රැඳී සිටීමේ බලපත් සහ ඡායා පිටපත්. (වසරක් තුල කරනු ලබන උපත් ලියපදිංචි කිරීමක් නම් ඡායා පිටපත් දෙක බැගින්ද වසරට වැඩිනම් ඡායා පිටපත් තුන බැගින්ද ඉදිරිපත් කරන්න.)

08. දරුවා ඉපදී මාස තුනක් ඇතුලත උපත ලියාපදිංචි කිරීමට නොහැකි වුයේනම් ප්‍රමාදවීමට හේතු දක්වමින් අයදුම්කරු විසින් කරනු ලබන ප්‍රකාශය.

09.උපත සහ පුරවැසි බව ලියාපදිංචි කිරීමේ ගාස්තුව යුරෝ 75.00 වන අතර වසරකට වඩා ප්‍රමාද වී කරනු ලබන ලියාපදිංචි කිරීම් සඳහා වසරකට යුරෝ 8.00 බැගින් වන දඩ මුදලක් අයකරනු ලැබේ.

10. ස්පාඤ්ඤය හෝ පෘතුගාලයේ සිට අයදුම්පත් ඉදිරිපත් කරනවිට මුල් පිටපත් ඉදිරිපත් කල නොහැකි නම් අදාල ඡායා පිටපත් (දෙක හෝ තුන) මුල් පිටපතෙහි සත්‍ය පිටපත් බව පිළිගත් රජයේ ආයතනයකින් රබර් මුද්‍රාව සහිතව සහතික කරවා ගෙන ඉදිරිපත් කළ යුතු අතර තැපැල් ගාස්තු සඳහා අමතර යුරෝ 10.00 ක් අයකරනු ලැබේ.

*සැලකිය යුතුයි.*

****අයදුම්කරුගේ අත්සන ඔහුගේ/ඇයගේ ගමන් බලපත්‍රයේ සඳහන් ආකාරයට විය යුතුයි. ඉහත 06/03 අවස්ථාව අදාල නොවේනම් අයදුම්කරු පමණක් පැමිණෙන්න.**

****නිවැරදි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහ ඉහත සඳහන් අදාල ලියවිලි දහවල් 12.00 පෙර කවුන්ටරය වෙත ලබා දියයුතු බව කරුණාවෙන් සලකන්න.**